# ඩිමොක්‍රැටිකයන් සහ "බුෂ්ගේ යුද්ධය"

**The Democrats and "Bush's war"**

**කර්තෘ මන්ඩලය විසිනි**
**2004 අප්‍රේල් 09**

ඉරාකයෙහි එක්සත් ජනපද මිලිටරි වාඩි ලා ගැනීමට ප්‍රතිරෝධය දක්වමින් ජාතිකව ව්‍යාප්ත යුද්ධයක් පුපුරා යාම මගින් එක්සත් ජනපද ආක්‍රමනයේ සාපරාධී ස්වභාවයත්, ඇමරිකානු ජනතාව නින්දා සහගත විජිත ව්‍යවසායකට ඇද දමනු ලැබූ සමස්ත දේශපාලන සංස්ථාපිතයේ සාපරාධී ස්වභාවයක් සලකුනු කෙරෙයි.

මෑත නැගිටීම්වල දී අඩු ම තරමින් එක්සත් ජනපද නාවික හා හමුදා භටයන් 40 දෙනෙකුගේ ජීවිත අහිමි වී තිබේ. ඉරාකීයයන්ගේ ජීවිත හානි ප්‍රමානය විජිත අධිකාරයන් විසින් ගනන් බලනු ලැබ හෝ නොමැති වුව ද රටෙන් ලැබෙන වාර්තාවලට අනුව එය දහස ඉක්මවා ඇති අතර, බොහොමයක් නිරායුධ මිනිසුන්, ගැහැනුන් හා ලමයින් ජනාකීර්න නාගරික ප්‍රදේශවලට එල්ල කෙරෙන බෝම්බ, මිසයිල හා කාලතුවක්කු ප්‍රහාරවලට ලක්ව ඇත.

ඊනියා සුන්නි ත්‍රිකෝනයේ සිට බැග්ඩෑඩයේ දුගී පැල්පත් ප්‍රදේශ හා දකුනු ඉරාකයේ ෂියා මුස්ලිම් බහුතරයක් සහිත විශාල සහ කුඩා නගර කරා කැරැල්ල පැතිරී යාම මගින්, තමන් ඉරාක ජනතාවගේ සහාය දිනා ගෙන ඇති බවටත් රටේ ස්වයං පාලන ආයතන ගොඩ නගා ඇති බවටත් වොෂින්ටනය කරන මවා පෑම් බේගල් බවට පත් කෙරී ඇත.

එක්සත් ජනපද කොන්ත්‍රාත්කරුවන්ගේ දැවැන්ත ලාභ පොදි ගසා ගැනීම් සමග ඒකාබද්ධව විදේශ ආක්‍රමනිකයාගෙන් දිනපතා එල්ල වන තාඩනපීඩන විසින් සහ ඉරාක තෙල් සම්පත් කොල්ල කෑමේ විනිවිද පෙනෙන එක්සත් ජනපද අරමුන විසින් මහජන කෝපය හා කැරලිකාරිත්වය අවුලුවනු ලැබ ඇත.

ඉරාකය තුල සිදු වන කැලඹිලිකාරී සිද්ධීන් විසින්, බුෂ් පරිපාලනය ධවල මන්දිරය තුල පැලපදියම් වීමෙන් පසු එය මුහුන දෙන ගැඹුරුතම අර්බුදය, නිර්මානය කෙරී තිබේ. සැලකිය යුතු බහුතරයක් එක්සත් ජනපද ජනාධිපතිවරයාගේ ඉරාක ප්‍රතිපත්තිය අනුමත නො කරන බව මත විමසුම්වලින් ප්‍රකාශ වන අතර, රටෙන් එක්සත් ජනපද හමුදාව ඉවත් කරන ලෙස කෙරෙන ඇමරිකානුවන්ගේ ඉල්ලීම් වැඩි වෙමින් තිබේ.

සමස්ත නගරයන් ම කැරලිකරුවන් අතට පත් වෙද්දී හා ෆලුජාහි ගෙයක් ගෙයක් පාසා දරුනු වීදි සටන් ඇවිලෙද්දී, බුෂ් පරිපාලනය නො නවත්වා කියා සිටින්නේ එක්සත් ජනපද මිලිටරිය පැටලී සිටින්නේ "මැරයන්ගේ" හා "ත්‍රස්තවාදීන්ගේ" කුඩා කන්ඩායමක් සමග පමනක් බව යි. "එය අවසානය දක්වා" ගෙන යන බවත් ඔවුහු තරයේ කියා සිටිති. දූෂිත හා ගැත්තර මාධ්‍යයන්හි බෙහෙවින් පුනරුච්චාරනය කෙරෙන්නේ ද මේ දේවල් ය.

එහෙත් පරිපාලනයේ ප්‍රකාශිත දේශපාලන විරුද්ධවාදීන් වන ඩිමොක්‍රැටිකයන් ගැන කෙබඳු ද? ඉරාකයෙහි නැගිටීම්වල ස්වභාවය පිලිබඳ පරිපාලනයේ බේගල් ඔවුහු හෙලිදරව් කරත් ද? ඇමරිකානු ජනතාවගේ නාමයෙන් ගෙන යන ම්ලේච්ඡ ක්‍රියා හෙලා දැකීමට ඔවුන් ඉදිරිපත් වී ද? එක්සත් ජනපද හමුදාවන්ට හා ඔවුන්ගේ පවුල්වලට සැබවින් ම සහාය දැක්වීම් වස්, මිය යන, අංග විකල වන හා කම්පනයට පත් වන තරුන ඇමරිකානු පිරිමින් හා ගැහැනුන් අන්තරායෙන් මුදාගෙන ඉරාකයෙන් ආපසු ගෙන්වීමට ඔවුහු බල කරත් ද? මෙම ප්‍රශ්න නැගීම ම ඒවාට පිලිතුරු සැපයීමකි.

නිසැකව ම, ඩිමොක්‍රැටික් පක්ෂ නිලධාරීන් අතර විවිධ අදහස් පවතී. මැසචුසෙට්ස්හි සෙනෙට් සභික එඩ්වර්ඩ් කෙනඩි අප්‍රේල් 5 වන දා පැවැත්වූ කතාවක දී ඉරාකය "ජෝර්ජ් බුෂ් ගේ වියට්නාමය" ලෙස හැඳින්වීම ගැන ඔහු රිපබ්ලිකානුවන්ගේ දැඩි කෝපයට ලක් වූ අතර ඔහුගේ පක්ෂය තුල යම් හෙලා දැකීමකට පවා ලක් විය. යුද්ධය සඳහා නිමිත්තක් සපයා ගැනීමට ජන සංහාරක අවි පිලිබඳ බොරු කීම ගැන පරිපාලනයට දෝෂාරෝපනය කල ඔහු, ඉරාකයට මැදිහත් වීමෙන් "ත්‍රස්තවාදයට එරෙහි සැබෑ යුද්ධයෙන්" අවධානය ඉවතට හරවා ඇති බවට චෝදනා නැගී ය. කෙසේ වුව ද, කෙනඩිගේ ඝෝෂාකාරී හෙලා දැකීම් තුල එක්සත් ජනපදය ඉරාකයෙන් ඉවත් විය යුතු බවට කිසිදු යෝජනාවක් හෝ යම් විකල්ප ප්‍රතිපත්තියක් කිසි සේත් ම ඇතුලත් නො වීම සැලකිය යුතු ය.

දකුනු ඩැකෝටාහි ටොම් ඩැෂ්ලි හා ඉන්දියානාහි ඊවන් බේහ් වැනි ඩිමොක්‍රැටික සෙනෙට් සභිකයෝ "අවසානය දක්වා ගෙන යාම" වැනි බුෂ්ගේ හඬ නැගීම් ම ප්‍රතිරාවය කලහ. බදාදා එන්බීසී රූපවාහිනියේ පැවති *ටුඩේ* වැඩ සටහනට සහභාගී වෙමින්, මිනී මැරීමටත් මිය යාමටත් හුරුපුරුදු වන ලෙස බේහ් ඇමරිකානුවන්ගෙන් ඉල්ලා සිටියේ ය. "මෙය වෙනත් ඕනෑම දෙයක් තරම් ම දැඩි වීර්යය පරීක්ෂාවට බඳුන් කිරීමකි" යි ඔහු කී ය. "එය දුෂ්කර වනු ඇත. අවාසනාවන්ත ලෙස අපට ඊයේ වැනි ඛේදවාචකයන් එලඹෙන බොහෝ දිනවල දී අත්විඳීමට සිදු වනු ඇත."

### ලිබර්මාන්: "දැඩි ලෙස බලය" යොදනු

සමහරු මර්දනකාරී ප්‍රචන්ඩත්වය තීව්‍ර කරන ලෙස පවා බුෂ් පරිපාලනය උනන්දු කලහ. පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා වීමට ද තරග කලා වූ කනෙක්ටිකට්හි ඩිමොක්‍රැටික සෙනෙට් සභික ජෝ

ලිබර්මාන්, ඉරාකයේ "ත්‍රස්තවාදීන්ට එරෙහිව සටන් වැද සිවිල් පාලනය පිහිටුවීමට" එහි සිටින එක්සත් ජනපද හමුදා නො සෑහෙන බව ප්‍රකාශ කලේ ය. "ඉරාකය තුල, ඇඩි බලය යෙදීමේ පවෙල් ධර්මය යොදා ගන්නා" ලෙස ඔහු බුෂ්ගෙන් ඉල්ලා සිටියේ ය. ඩිමොක්‍රැටික් පක්ෂ ජනාධිපති අපේක්ෂක ලෙස සලකනු ලැබෙන මැසචුසෙට්ස්හි සෙනෙට් සභික ජෝන් කෙරීගෙන් ඔහු ඉල්ලා ඇත්තේ එක්සත් ජනපද මිලිටරි කටයුතු ඉහල නැංවීමේ සැලැස්මක් සකස් කිරීමට ජනාධිපතිවරයා සමග එක් වන ලෙස යි.

ඉරාක ප්‍රශ්නයට පිවිසීමේ දී කෙරී ද පියවර තබන්නේ ඉතා ප්‍රවේසම් සහගතව ය. ආර්ථිකය ගැන බදාදා කල කතාවක දී මෑත සිද්ධීන් පිලිබඳව කට ඇරීමට සිදු වූ තතු තුල ඔහු මෙසේ ප්‍රකාශ කලේ ය: "ඉරාක පිලිවෙත සම්බන්ධව ප්‍රවිෂ්ට වන්නේ කෙසේ ද යන්න පිලිබඳව කුමන මත භේද තිබුනත් අපට සමහර මත භේද පවතී අපගේ හමුදාවලට සහාය පිනිස හා අපගේ අවසන් අරමුන වන ස්ථාවර ඉරාකයක් සඳහා අපි සියලු දෙනා ජාතියක් වසයෙන් එකමුතු වී සිටින්නෙමු."

කුමන බියගුලුකමක් ද. වියට්නාම් විරෝධී ප්‍රවීනයන් ය යි කියන කන්ඩායමක නායකයා ලෙස සිය දේශපාලනය ආරම්භ කල කෙරී, ඉරාකයේ සිර වී සිටින වැඩි දෙනෙකු දැනට අවුරුද්දකට වැඩි කලක් තිස්සේ ය. හමුදාවේ බොහෝ දෙනෙකුට අවශ්‍යව ඇති "සහාය" වන්නේ තම නිවෙස් කරා පියාසර කිරීමට ගුවන් යානයක් බව හොඳාකාරව ම දනියි.

ඉරාක ජනතාව එක්සත් ජනපද හමුදාවන් පුෂ්පෝපහාරයෙන් පිලිගනු ඇතැයි පුරෝකථනය කල පරිපාලනයට දොස් පවරන අතරතුර, කෙරී සිය මූලික ප්‍රහාරය එල්ල කර ඇත්තේ, ජූනි 30 වන දා ද්‍රෝහී ආන්ඩුව වෙත ස්වෛරීත්වය පැවරීමෙහි බුෂ් පරිපාලනයේ ප්‍රකාශිත සැලසුම් කෙරෙහි ය. මෙහි ගම්‍ය අර්ථය වන්නේ එක්සත් ජනපදය විජිත පාලනය හා මර්දනය දිගට ම පවත්වා ගෙන යා යුතු බව යි.

සීමිත දුරකට මීට සමානත්වයක් දරන අදහස් එක්සත් ජනපදයේ ප්‍රධාන දිනපතා පුවත්පත් වල ආදි කාලීන ලිබරල් තීරු රචකයන් අතර ද සොයා ගත හැකි ය. යුද්ධයට විරුද්ධත්වය දක්වන්නෙකු වූ හැරල්ඩ් මෙයර්සන්, බදාදා "විකල්පයකින් තොරව ඉරාකය තුල" නම් වූ ශෝකාලාපයක් *වොෂින්ටන් පෝස්ට්* පුවත්පතට ලිවී ය. බුෂ් පරිපාලනයේ පිලිවෙත් මගින් "ධනවාර්ගික ජාතිකත්වය" නම් ව්‍යාපෘතියට මරනීය ප්‍රහාරයන් එල්ල කෙරී ඇති බැව් ප්‍රකාශ කිරීමෙන් පසුව මෙයර්සන් තම කතාව නිම කලේ ඉරාකය තුල වැඩ පිලිවෙල දිගට ම කර ගෙන යාම හැර වෙනත් විකල්පයක් නොමැතිව තිබූ බව සඳහන් කරමිනි. ඔහුගේ තර්කනයට අනුව ආක්‍රමනයේ සාපරාධී හා දුරාචාරී ස්වභාවය මගින්, රට දිගට ම යටත් කර ගෙන සිටීම සදාචාරවත් වගකීමක් බවට පත් කෙරී ඇත.

"එහෙත් හරියට ම මෙය අප සටන් නො කල යුතුව තිබුනා වූ යුද්ධයක් වීම නිසා ම අප නැගිට ඉන් පිටව යන්නේ නම් එය දේශපාලනික හා සදාචාරාත්මක දෙපිටකාට්ටුකමක් වන්නේ ය" යි මෙයර්සන් ලිවී ය. "නො කල යුතුව තිබූ වේලාවක අපි ඉරාක පාලනය පැහැර ගත්තෙමු. ආගමික කන්ඩායම්වල ප්‍රචන්ඩත්වය වඩාත් නරක අතට හැරෙමින් තිබිය දී එයට ම අත හැර ඉන් ඉවත් වීම දුක් මුසු අවසානයක් විය හැකිව තිබින. ඇමරිකානු ජනතාව ඉදිරියේ ඇති එක ම නිසැක හා සුදුසු තෝරා ගැනීම වන්නේ අප මෙම අවුලට ඇද දැමූ ජනාධිපතිවරයා ඉවත දැමීම යි."

නොවැම්බරයේ දී කෙරී ජය ගත හොත් සිදු විය හැක්කේ කෙතරම් සුලු වෙනසක්දැයි මීටත් වඩා පැහැදිලි කල නො හැක්කේ ය.

මීලඟට සිටින්නේ, මැද පෙරදිග ප්‍රජාතාන්ත්‍රීයකරනයේ දූත මෙහෙවරක් ලෙස යුද්ධය මතු කර දැක්වූ, වර්නනාවිෂයාතික්‍රාන්ත, *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රයේ තෝමස් ෆ්‍රීඩ්මාන් ය. ඔහුගේ මාධ්‍යවේදී වෙලඳ නාමය වන උපාසකකම, ප්‍රෝඩාකාරී බව හා හිස්කම මිශ්‍රව වැගිරෙන තවත් තීරුවක් ඔහු බ්‍රහස්පතින්දා රචනා කලේ ය.

තීරු ලිපිය "ඉරාකය තුල ඉරාකීයයන් කිසිවෙක් වෙත් ද?" යන කුපිතකාරී උද්ඝෘතයෙන් යුක්ත විය. සුන්නි හා ෂියා වැනි ඉරාකීයයන් තමන්ට වෙඩි පිට වෙඩි තබන නිසා ඉරාකීයයන් සිටින බැව් දන්නා එක්සත් ජනපද සොල්දාදුවන් විසින් කිසි විටෙකත් නො නැගෙන ප්‍රශ්නයකි මේ. ආගමික කන්ඩායම්වාදය හා අන්තවාදය මගින් ඉරාක කැරැල්ල මුලුමනින් ම ඇවිලවුනු බව ෆ්‍රීඩ්මාන් උද්ධච්ච ලෙස කියා සිටියි. මින් මතු කෙරෙන ප්‍රශ්නය වන්නේ මෙම නැගිටීම මැඩ පැවැත්වීමට ඉරාකයේ "නිශ්ශබ්ද බහුතරය" ඉදිරියට පැමිනේ ද යන්න බව ඔහු තව දුරටත් සඳහන් කරයි.

"තමන් ෂියා, සුන්නි හෝ කුර්දි වසයෙන් නො ව ඉරාකීයයන් ලෙස හඳුන්වා ගැනීමට සුදුසුකම් ඇති තීරනාත්මක ජන සමූහයක් එහි සිටින්නේ ද? ඔවුන් සමස්ත ඉරාක ජනතාවගේ ම ස්වයංනිර්නය අයිතිය සඳහා සටන් කිරීමට සූදානම් ද?" යි ඔහු ලිවී ය.

ෆ්‍රීඩ්මාන්ගේ ස්වයං නිර්නය සංකල්පය ස්වයං නිර්නය යනු විසිවන සිය වස පුරා ම සැලකිය යුතු විකෘත කිරීම්වලට බඳුන් වූ පදයකි -- ලොව මෙතෙක් සකසන ලද වඩාත් ම අගති සහගත අර්ථ දැක්වීම ලෙස ශ්‍රේනිගත කල ස්වයං නිර්නය සඳහා සටන් කිරීමේ දී "සැබෑ ඉරාකීයයන්" ඉරාක භූමියෙන් විදේශීය හමුදා නෙරපීමට ඉල්ලා සිටින්නවුන්ට එරෙහිව එක්සත් ජනපද ආක්‍රමනිකයාගේ පාර්ශ්වය ගත යුතු බව ඔහු තම පාඨකයන්ට කියා සිටියි.

"ඉරාකයේ නිශ්ශබ්ද බහුතරය" (මෙම අපකීර්තිමත් දේශපාලන යෙදුමේ නිර්මාතෘ වන රිචඩ් නික්සන් වෙත ඒ සඳහා ගෞරවය පිරිනැමීමට ෆ්‍රීඩ්මාන් අසමත් වෙයි) නො මග යැවීම සඳහා, "ඇමරිකානු විරෝධී වෙස් මුහුනකට මුවා වී සිය සැබෑ අරමුනු සඟවන" බවට ඔහු කැරලිකරුවන්ට දොස් පවරයි. ෆ්‍රීඩ්මාන් කියන ආකාරයට නිශ්ශබ්ද බහුතරය ඉරාකයේ එක්සත් ජනපද ව්‍යාපෘතියට සහාය දක්වන්නේ නම්, එවන් ඇමරිකානු විරෝධී වෙස් වලා ගැනීමකට ජනතා සිත් ඇද ගැනීමක් පවත්වා ගත හැක්කේ කෙසේදැයි පැහැදිලි නො කෙරෙයි. එක ම තර්කානුකුල නිගමනය (ෆ්‍රීඩ්මාන් එවන්

තාර්කික හැකියාවකින් යුක්ත නම්) වන්නේ කැරලිකරුවන් මෙන් ම මෙම බහුතරය ද ස්වයං නිර්නය දැකගන්නේ එක්සත් ජනපද ග්‍රහනය පෙරලා දැමීම ලෙස බව යි.

ආක්‍රමනික හමුදාවලට සෑහෙන තරම් සම්පත් සැපයීමට අසමත් වීම පිලිබඳව බුෂ් පරිපාලනය විවේචනය කරමින් ඔහු මෙසේ හමාර කරයි: “දැන් කල යුතු හරි දේ නම් දිගට ම කර ගෙන යාම බැව් මම දනිමි. දුෂ්ටයන් පරාජය කරමින්, සටන්කරුවන් නිරායුධ කරමින් දේශපාලන රාමුවක් ගොඩ නැගීමට උත්සාහ කල යුතු ය. ... එහෙත් මෙය කල් ගත වන හා කැප කිරීම් අවශ්‍ය වන දෙයකි. ඒ දේවල් ඇති තරමින් උපදවා ගත හැක්කේ ඒ සඳහා එක්සත් ජාතීන්, නේටෝව හා අපගේ මිත්‍ර පාක්ෂිකයන් සහභාගී කර ගැනීමෙන් පමන ය.”

## ඉරාක යුද්ධය පිලිබඳ විවාදය නීති විරෝධී කිරීම

මෙම වචන කෙලින් ම කෙරීගේ මුවින් ගලා ආ හැකි ය. නොවැම්බර් මැතිවරනය ලඟා වෙද්දී, ඩිමොක්‍රැටික වේදිකාවේ මූලික ප්‍රස්තුතය වනු ඇත්තේ ඉරාකය යි. එය යුද්ධය සූදානම් කල ආකාරය හෝ එක්සත් ජාතින්ගේ පිටුබලය ඊට ලබා ගැනීමට අසමත් වීම හෝ ගැන බුෂ් පරිපාලනය විවේචනය කරනවා විය හැකි ය. එහෙත් ඉරාක ජනතාවට එරෙහිව යුද්ධය පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් කිසිදු විවාදයක් කල නො හැකි ය.

ඉරාක මිලිටරි ග්‍රහනය සම්බන්ධයෙන් ඩිමොක්‍රැටික් පක්ෂ නිලමක්කරුවන් අතර ද ඉන් නිකුත් වී මාධ්‍යයේ ලිබරල් හඬ බවට ද පත් වන මෙම අත්‍යවශ්‍ය එකමුතුව ඇමරිකානු පාලක ප්‍රභූවේ මූලික අවශ්‍යතාවන් පිලිබිඹු කරයි. මෙය හොඳින් ගනන් බලා දේශපාලනිකව සකසන ලද ඩිමොක්‍රැටික් පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා නම් කිරීමේ තරගයෙහි ප්‍රතිඵලය ද වේ.

පසු ගිය වසරේ ඩිමොක්‍රැටික ප්‍රාථමිකයන් කරා වූ වර්ධනය තුල, ඉරාක යුද්ධයට එරෙහි පුලුල් ජනතා විරෝධය පිලිබිඹු කලා වූ දේශපාලන ක්‍රියාවාදය ආධිපත්‍යය ඉසිලී ය. ආරම්භයේ දී මෙම ක්‍රියාවාදය වැඩි වශයෙන් ම යොමු කෙරුනේ හිටපු වර්මොන්ට් ආන්ඩුකාර හොවාඩ් ඩීන්ගේ දක්ෂතාව පසු පසිනි. ප්‍රාථමික ඡන්දයේ මුල් වටයෙහි දී ඩීන් මතු වී ආවේ ඉදිරියෙන් ම සිටින්නා ලෙසිනි. මෙය යුද්ධයට සහාය දැක්වූ ඩිමොක්‍රැටිකයන් ද බුෂ් පරිපාලනය ද යන දෙක ම ඔහු විසින් හෙලා දකිනු ලැබීමේ ප්‍රතිඵලය විය. උල්කාවක් බඳු වූ ඔහුගේ නැගීම දේශපාලන සංස්ථාපිතය තුල අන්තරය ඇඟවීමේ සීනු නාද කලේ ය.

2004 දී බුෂ් පරාජය විය හැකි ය යන වැටහීම මගින් (පාලක ප්‍රභූවේ කොටස් ඔවුන්ගේ ම හේතු කාරනා මත සුදුසු විකල්පයක් වෙතට වඩ වඩාත් නැඹුරු වීමේ ප්‍රතිඵලය ලෙස) පරීක්ෂාවට බඳුන් වූ හා විශ්වාස කටයුතු ඩිමොක්‍රැටික අපේක්ෂකයන් තෝරා ගැනීම ආවශ්‍යක කෙරුනි. ඇෆ්ගනිස්ථාන යුද්ධයට තමා දුන් සහයෝගය ගැන ද ඉරාකය ආක්‍රමනය කිරීමට ගත් තීරනය පිලිබඳව සිය විවේචන තිබුනේ වී නමුදු එරටෙහි එක්සත් ජනපද මිලිටරි ග්‍රහනය පවත්වා ගෙන යාමට තමා දක්වන අනුකර්ලතාව ගැන ද අවධාරනය කරමින්, තමන් හෙලා දකින්නවුන් සන්සුන් කිරීමට ඩීන් සිය උපරිම ශක්තිය යොදනු ලැබුව ද ඔහු දේශපාලනිකව නුසුදානම් ප්‍රතිවාදියෙකු ලෙස හඳුන්වමින් මාධ්‍ය මගින් ඔහුට එරෙහිව නිර්දය ප්‍රහාරයක් දියත් කරන ලදී. තෝරා නො ගත හැක්කෙකු හා වැනෙනසුලු අයෙකු ලෙස ඩීන් චිත්‍රනය කෙරුනු අතර එක්සත් ජනපද සෙනෙට් සභාවේ ධනවත් ම හා පරිනත සභිකයෙකු මෙන් ම සිය හෘදයෙන් ඉරාක යුද්ධයට බලය පැවර වෙකු වූ ජෝන් කෙරී පිටු පස සහයෝගය පෙල ගස්වනු ලැබුනි.

මෙම සටකපට දේශපාලන උප්පරවැට්ටිවල අත්‍යවශ්‍ය අරමුන වූයේ ඩීන්ගෙන් එල්ල වන තර්ජනයක් වැලැක්වීම නො ව -- ඔහු මධ්‍යස්ථ, සංස්ථිතික ධනපති දේශපාලනඥයෙකි -- දේශපාලන ක්‍රියාවලිය තුල යුද්ධ විරෝධී මනෝගතියෙහි බලපෑම අවම කිරීම හා ජනාධිපතිවරනයේ සන්දර්භය තුල එක්සත් ජනපද මිලිටරි ග්‍රහනයට පතුලෙන් මතු වී ආ හැකි අභියෝගයක් වලක්වා ගැනීම යි. ඉරාකයේ මෑත ම සිද්ධීන් විසින් පෙන්නුම් කෙරී ඇත්තේ මෙය එතරම් ම අවශ්‍ය වූයේ ඇයි ද යන්න යි. ඉරාක යුද්ධය පිලිබඳ මොන ම බැරෑරුම් විවාදයක් හෝ ඉවත් කර තැබීමේ දේශපාලන අරමුන සාක්ෂාත් කර ගෙන ඇති බව ඩිමොක්‍රැටිකයන්ගේ ප්‍රතිචාරයෙන් සනාථ වේ.

ඉරාක ජනතාවට එරෙහිව ගෙන යන යුද්ධය හුදෙක් බුෂ් පරිපාලනයේ සාපරාධී ව්‍යාපෘතියක් පමනක් නො වේ. එය ද්විපාර්ශ්වික ප්‍රතිපත්තියකි. ඉරාක මහජනතාව “අත හැර නො දැමීම” පිලිබඳව චිර කාලීන ඩිමොක්‍රැටික ලිබරලුන්ගේ සියලු වර්ගයේ අත් ඇඹරීම් පිටු පස ඇත්තේ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ මූලෝපායික අවශ්‍යතාව වන ඉරාකයේ මෙන් ම මුලු මහත් මැද පෙරදිග ම තෙල් සම්පත් මත මාරාන්තික මිලිටරි ග්‍රහනයක් පවත්වා ගැනීම යි.

කෙරී තේරී පත් වීම ඉරාකයෙන් ඇමරිකානු හමුදා ඉවත් කර ගැනීමක් අර්ථවත් නොකරයි. එහි දී ඔවුන් වැඩි වැඩියෙන් මරමින් ද මිය යමින් ද සිටිනු ඇත. මෙම සංහාරයට පවතින විරෝධය දේශපාලනිකව පෙරට ගෙන යා හැක්කේ ඩිමොක්‍රැටික් පක්ෂයෙන් තීරනාත්මකව බිඳී ගැනීමෙන් හා යුද්ධයට හා සමාජ අසමානතාවට එරෙහිව සටන් වැදීමේ අධිෂ්ඨානය සහිත වැඩ කරන ජනතාවගේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් පැන නැගීමෙන් ද වේ.

සමාජවාදී සමානතා පක්ෂය හා එහි අපේක්ෂකයන් 2004 එක්සත් ජනපද මැතිවරනයට සහභාගී වන්නේ එවන් ව්‍යාපාරයකට දේශපාලන පදනම් දැමීම සඳහා ය. අපගේ පක්ෂය, ඉරාකයෙන් වහා ම හා කොන්දේසි විරහිතව එක්සත් ජනපද හමුදා ඉවත් කර ගැනීමේ සහ මෙම යුද්ධය දියත් කිරීමට කුමන්ත්‍රනය කිරීම සම්බන්ධයෙන් සාපරාධීව වග කිව යුතු සියලු දෙනා අල්ලා දඬුවම් කිරීමේ ඉල්ලීම් අඛන්ඩව මතු කරනු ඇත.

© www.wsws.org